රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 329

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1986.05.19 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

විශ්‍රාම ගැනීමෙන් අනතුරුව නැවත සේවයේ යොදවන
නිලධාරීන්ගේ නිවාඩු - ආයතන සංග්‍රහය - XII පරිච්ඡේදය

පහත දැක්වෙන පරිදි 37 වන වගන්තිය එකතු කරන්න.

37. විශ්‍රාම ගැනීමෙන් අනතුරුව නැවත සේවයේ යොදවන නිලධාරියෙකුගේ නිවාඩු.

37 : 1 විශ්‍රාම ගැනීමෙන් අනතුරුව නැවත සේවයේ යොදවන නිලධාරියෙකුට,

37 : 1 : 1 සේවා කඩවීමක් නොමැතිව නැවත සේවයේ යොදවන ලද නම්,

(i) නැවත සේවයේ යොදවන ලිත් වර්ෂයේදී නැවත සේවයේ යෙදවීමට පෙර සිටි තනතුරේ ඉතිරි නිවාඩු,

(ii) ඊට පසු ලිත් වර්ෂ සඳහා, නව තනතුරට අදාල නිවාඩු,

ලබා දිය හැකිය.

37 : 1 : 2 සේවා කඩවීමක් ඇති ව නැවත සේවයේ යොදවන ලද නම්,

(i) නැවත සේවයේ යොදවන ලද කාලය සඳහා නැවත සේවයේ යොදවන ලද ලිත් වර්ෂයේ තනතුරට අදාල අනුපාතික නිවාඩු,

(ii) ඊට පසු ලිත් වර්ෂ සඳහා, තනතුරට අදාල නිවාඩු,

ලබා දිය හැකිය.

Siriwardhana (signature)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.